# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
# பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
# UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය
எனது இலக்கம்
My Number
} UGC/HR/2/9/86(17th Vol.)

තැපැල් පෙට්ටිය
அஞ்சல் பெட்டி
Post Office Box
} 1406

ඔබේ අංකය
உமது இலக்கம்
Your Number
}

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
௨0, வார்ட் இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.


2020.07.23

ලේකම්
විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව

<u>විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල වැටුප් හා විෂමතා ගැටළුව විසඳීම සඳහා කමිටු නිර්දේශ ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් එවන ලද 2020.07.09 දිනැති ලිපිය හා බැඳේ.

විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයෙහි වැටුප් විෂමතා ගැටළුව විසඳීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පත්කරන ලද කමිටුව ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ සභාපතිත්වයෙන් 2020.02.28 දින රැස්වීමක් පවත්වන ලදි. එහිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 04/2016 සහ 04/2016(i) චක්‍රලේඛ මඟින් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ඇති වී ඇති වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති එකමුතුව විසින් ලබාදුන් යෝජනාවලිය UGC/HR/2/9/86 (17th Vol.) අංක දරන 2020.03.02 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

මෙම ගැටළුව සම්බන්ධයෙන් නිර්දේශ ඇතුලත් අවසාන වාර්තාව ඉදිරිපත් කලයුතු අවසන් දිනය 2020 මාර්තු මස 15 ලෙස සඳහන් කර තිබුන ද, අනපේක්ෂිත ලෙස ඇති වූ COVID-19 වසංගතය හේතුවෙන් රටේ පවතින තත්ත්වය පිළිබඳ සලකා බලා එය 2020 ජූනි මස 30 වන දින දක්වා දීර්ඝ කළ බව අග්‍රාමාත්‍ය ලේකම් විසින් මා වෙත 2020.06.03 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

එම නිසා විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයෙහි වැටුප් විෂමතා ගැටළුව විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඇතුලත් අවසාන වාර්තාව 2020 ජූනි මස 30 වන දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකළයුතු බව සඳහන් කරමින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ කඩිනමින් ලබාදෙන ලෙස 2020.06.16 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක්ද සිදුකර ඇත.

එයට ප්‍රතිචාරයක් ලෙස, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2020.06.16 දින ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වූ බවත්, 2020.07.16 දින තවත් සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත්, ඉහත සාකච්ඡාවෙන් පසුව ජාතික වැටුප් කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශද සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයෙහි වැටුප් විෂමතා ගැටළුව විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ඉදිරිපත්කර ඇති යෝජනාවලිය සම්බන්ධයෙන් කඩිනම් පිළිතුරක් යොමු කිරීමට කටයුතු කරන බව මා වෙතද පිටපතක් සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත 2020.07.14 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්
(සාමාජික/ලේකම්,විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල වැටුප් විෂමතා ගැටළු විසඳීම සඳහා පත්කරන ලද කමිටුව)


දුරකථනය
தொலைபேசி
Telephone
} 2695301
2695302
2692357

ෆැක්ස්
பெக்ஸ்
Fax
} 2688045

වෙබ් අඩවිය
வெப் தளம்
Website
} http://www.ugc.ac.lk